කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 02 කොටස - 2020
-------------------------------------------------------------------------------------
කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය- 02 කොටසේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02හි II වගන්තියේ ආ.3 සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය
-----------------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. යාපනය, මුලතිව්, අනුරාධපුරය, මඩකලපුව, මොණරාගල, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. තවද, තරගකාරී සහ අලවිකළ හැකි භාණ්ඩ නිපදවීමට, වෙළඳපොළ අවශ්‍යතා සඳහා ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය දෙසට ගමන් කිරීම යන කටයුතු සඳහා සුළු පරිමාණ ගොවීන්ට සහයවීම කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 02 කොටස යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,175.88 කට සමාන එජඩො මිලියන 642.87ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

1.3 මතය
-------

ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
-------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනමාවංචා හා වැරදි නිසා ඇතිවන ප්‍ර, ණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේසාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන . මාණාත්මකකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමිත ප්‍ර ලංකා විගණන ප්‍රශ්‍රී,නමුත්සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇතවංචා හා වැරදි තනි හෝ . ණාත්මකමාසාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රඅවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ .

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 10 දිනැති අංක 02/2016 දරන චක්‍රලේඛය | ව්‍යාපෘතිය මගින් අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීමට හෝ ව්‍යාපෘතියේ ගනුදෙනු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි සමාලෝචිත වර්ෂය තුළදී සමාලෝචන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | චක්‍රලේඛ උපදෙස් සමග අනුකූලවීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ කටයුතු සංරචක 5ක් යටතේ ක්‍රියාත්මක වේ.

(අ) ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීම
(ආ) නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම
(ඇ) නිෂ්පාදන සහ අලවිකරණ යටිතල පහසුකම් සැපයීම
(ඈ) විශ්ලේශණ සහ ප්‍රතිපත්ති උපදේශන සහය ලබාදීම
(ඉ) ව්‍යාපෘති කළමනාකරණය, නියාමනය සහ ඇගයීම

| | සංරචකය | ක්‍රියාකාරකම් | විගණන ගැටලු | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | නවීන කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු බඳවා ගැනීම | සංරචකයේ භෞතික ප්‍රගතිය වර්ෂය අවසාන වන විට අපේක්ෂිත ඉලක්කවලට පිටුපසින් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ සියලු කටයුතුවලට බලපා තිබුණු අතර ප්‍රමාද වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ජාත්‍යන්තර සේවා සපයන්නා සමග විධිමත් සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය අතර ප්‍රමාද වූ කටයුතු ආවරණය කර ගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | විශ්ලේෂණ හා ප්‍රතිපත්ති උපදේශන සහාය | ප්‍රතිපත්ති සංවර්ධනය | ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 69.55කට කොන්ත්‍රාත් 08ක් උපදේශන සමාගම වෙත පිරිනමා තිබුණු | පිළිතුරු සපයා නොමැත. | කටයුතු නිම කිරීමට අදාළ පාර්ශවයන්ට පෙළඹවීමට අවශ්‍ය පියවර ගත යුතු අතර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුව රු.මිලියන 55.5ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා වන අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | | ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | ගොවි පුහුණු කිරීම සහ ධාරිතා වර්ධනය | ගොවි පුහුණුව | වතු ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර නවීන කෘෂිකාර්මික තාක්ෂණික උද්‍යානවල කෘෂිකාර්මික කටයුතු පිළිබඳ පුහුණුව ලබාදී තිබුණි. එම නිසා 2018, 2019 සහ 2020 වර්ෂවලදී දරන ලද රු. මිලියන 45.76ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතියේ විෂය පථය සමග අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ඈ) | නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් සැපයීම | නිෂ්පාදන සහ අලෙවිකරණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම | ජාත්‍යන්තර සේවා සපයන්නෙකු බඳවා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති සංරචක මගින් ආවරණය නොවන නියමු ව්‍යාපෘති ප්‍රදේශයේ ග්‍රාමීය මාර්ග, ග්‍රාමීය ටැංකි, වගා ළිං සහ ගබඩා පහසුකම් පුනරුත්ථාපන සඳහා එකතුව එ.ජ.ඩො මිලියන 6.15ක් වැය කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමේ අරමුණින් ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ සඳහන් අරමුණු සමග කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අන්තර්ජාතික සේවා සැපයීමේ ගිවිසුම ආරම්භ වී මාස 04 ක් තුළ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවද, වාර්තාව මාස 02ක ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී නොතිබුණි. ඊට අමතරව දිගුකාලීන ප්‍රධාන උපදේශකවරු හතර දෙනෙකු සේවයේ නියුක්ත කළ යුතුය. කෙසේවෙතත්, එක් උපදේශකවරයෙකු පමණක් පත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු. මිලියන 183.33ක් ගෙවා තිබුණි. | පිළිතුර සපයා නොමැත. | සේවා සපයන්නා විසින් ක්‍රියාත්මක කෙරෙන කටයුතු පිළිබඳව සමීප අධීක්ෂණයක් අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 ඔක්තෝබර් 28 දින රු.මිලියන 8.25ක ඇස්තමේන්තු ගත පිරිවැයකට ප්‍රතිලාභීන්ගේ තොරතුරු පද්ධතියක් සැලසුම් කිරීම, සංවර්ධනය, ස්ථාපනය සහ නඩත්තු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර 2019 වර්ෂයේදී රු.මිලියන 1.65ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, කටයුතු නිම කර නොතිබුණි. | පිළිතුර සපයා නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුම්වල අවශ්‍යතා සමග අනුකූල වීමට කොන්ත්‍රාත්කරු යොමු කිරීමට අවශ්‍ය පියවර |
| (ඇ) | 2019 සහ 2020 වර්ෂවලදී රු. මිලියන 101 සහ රු.මිලියන 46 පිරිවැයකට කෘෂි ව්‍යාපාර පාසැල් පුහුණුව සහ කෘෂි නිෂ්පාදන සංවිධාන පුහුණුව සඳහා වන කොන්ත්‍රාත් පිරිනමා තිබුණද, අදාළ පුහුණු වැඩසටහන් අවශ්‍ය මට්ටමින් සිදු කර නොතිබුණි. මෙම තත්ත්වය නොසලකමින්, 2020 ජනවාරි ගොවි ව්‍යාපාර පාසල් පුහුණු සඳහා රු. මිලියන 36ක පිරිවැයකට වෙනත් ගිවිසුමක් කොන්ත්‍රාත්කරු සමග අත්සන් කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමග අනුකූලවීමට සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඈ) | ඌව පළාතේ සිදු කරන ලද විගණන පරීක්ෂාවකට අනුව, කොන්ත්‍රාත් ගිවිසුමට අනුව රු. මිලියන 127ක් වටිනා කොන්ත්‍රාත් 05ක ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂය අවසාන වන විට නිම කළ යුතුය. කෙසේවෙතත්, අදාළ කටයුතු 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීම අවශ්‍ය අතර අමතර පිරිවැය වළක්වා ගැනීමට කොන්ත්‍රාත් කටයුතු කාලීනව නිම කිරීමට සහතික විය යුතුය. |
| (ඉ) | 2019 ජනවාරි 01 දින උපදේශන ආයතනයක් වෙත ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 5.86 කට නියමු ව්‍යාපෘතියේ අගයදාම විශ්ලේෂණ සහ වෙළඳපල ඇගයීම සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර 2019 මාර්තු 31 දින වන විට නිම කිරීමට අපේක්ෂිත විය. ලැබී තිබුණු තොරතුරු අනුව, 2021 ජනවාරි 31 විගණිත දින වන විටත් අදාළ කටයුතු නිමකර නොතිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ සඳහා එකතුව රු. මිලියන 3.51ක් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමග අනුකූලවීමට සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

3.3 වැඩබිම් පරීක්ෂාවේදී කරන ලද නිරීක්ෂණ

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති යෝජනාවට අනුව, **02** වන වර්ෂයේ සිට අක්කරයට කිලෝග්‍රෑම් **18,000**ක ඵලදාවක් ලබා ගැනීමට මුරුංගා වගාව සඳහා රු. මිලියන **39**ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, **2021** පෙබරවාරි **03** දින මොනරාගල දිස්ත්‍රික්කයේ සිදු කරන ලද භෞතික පරීක්ෂාවකට අනුව පැළෑටිවල මන්දගාමී වර්ධනය සහ වගාවට සිදු වී ඇති හානි හේතුවෙන් අපේක්ෂිත ඵලදාව ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකක කටයුතු පිළිබඳව විධිමත් නියාමන සහ අධීක්ෂණ ක්‍රමවේදයක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ව්‍යාපෘතිය අනුරාධපුර සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවල කෝමාරිකා වගා කිරීම සඳහා එකතුව රු. මිලියන **47.33**ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, **2020** පෙබරවාරි පැවති නියගය සහ **2021** පෙබරවාරි පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් අපේක්ෂිත ඵලදාව ලබාගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘති කළමනාකරණ ඒකක කටයුතු පිළිබඳව විධිමත් නියාමනයක් සහ අධීක්ෂණය ක්‍රමවේදයක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුලදී අම්පාර, අනුරාධපුර, බදුල්ල, මාතලේ සහ මොණරාගල පළාත් ව්‍යාපෘති කළමනාකරණය කාර්යාලවලට භාරදීමට රු. මිලියන **141** වටිනා කෘෂිකාර්මික උපකරණ මිලදී ගෙන තිබුණද, ගොවීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ අසම්පූර්ණවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මාස **07**කට වඩා වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ගොවි යන්ත්‍ර සහ උපකරණවල සැබෑ අවශ්‍යතාව නිසි පරිදි තක්සේරු කළ යුතුය. |

3.4 ඌන උපයෝජිත සම්පත්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| යුරෝපා සංගමයෙන් යුරෝ මිලියන **25**ක ප්‍රදාන ලබා ගැනීමේ අරමුණින් **2020** වර්ෂයේදී ව්‍යාපෘතිය එහි භූගෝලීය ආවරණය බදුල්ල, කිලිනොච්චිය, අම්පාර සහ වව්නියාව ඇතුළුව පුළුල් කර තිබුණි. කෙසේවෙතත්, **2021** පෙබරවාරි **10** විගණිත දින දක්වා වන විටත් එය ලැබී නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘති සඳහන් ඉලක්ක සමග අනුකූලවීම පියවර ගත යුතුය. |

**3.5** මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණන නිර්දේශ |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී පේර සහ කෙසෙල් අපනයන වැඩසටහන සඳහා එකතුව රු. මිලියන 3.6ක් වැය කර තිබුණද, 2021 පෙබරවාරි 10 විගණිත දින වන විටත් කිසිදු පේර හෝ කෙසෙල් අපනයනය කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සමග අනුකූලවීමට සේවා සපයන්නා පෙළඹවීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සියලුම කටයුතු ආවරණය වන පරිදි මූලික ප්‍රසම්පාදන සැලැස්ම ව්‍යාපෘතිය පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගොවීන් අතර බෙදා දෙන ලද ගොවි යන්ත්‍ර සහ උපකරණ වර්ෂය පුරාම මිලදී ගෙන තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘතිය මූලික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |